# ගම්මාන සංකල්පය හා ආර්ථික සංවර්ධනය

**ජේ.ඩබ්.ද. සොයිසා**
**නියෝජ්‍ය අධ්‍යක්ෂ - සම්බන්ධීකරණ**
**ක්‍රම සම්පාදන අංශය**

ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදනයට කෘෂිකාර්මික අංශයට වඩා කාර්මික අංශය දායක වන බැවින්, ලංකා ආර්ථිකය කාර්මික ආර්ථික ව්‍යුහයක් කරා වෙනස් වෙමින් පවතී. අප මුහුණපාන ගැටළුවලට පිළියමක් වශයෙන් ආර්ථිකය කාර්මීකරණය කරා යොමු කිරීම හා මෙහෙයවීම කාලීන ආර්ථික සංවර්ධන ක්‍රියා මාර්ගයක් ලෙසට ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් පිළිගෙන ඇති බැව් නොරහසකි. ඒ අනුව කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ජාත්‍යාන්තර තරඟකාරීත්වය දක්වා ගෙන ඒම සඳහා රාජ්‍ය අංශයේ සහයෝගය වඩාත් අවශ්‍ය වෙයි.

2003 මහ බැංකු වාර්තාවට අනුව 2002 වර්ෂයේ නාගරික අංශයේ ගෘහස්ථ ඒකකයක සාමාන්‍ය මාසික ආදායම රුපියල් 23,436 කි. එමෙන්ම ග්‍රාමීය අංශයේ ගෘහස්ථ ඒකකයක සාමාන්‍ය මාසික ආදායම රු.11,819 ක් වෙයි. එය වතු අංශයේ රුපියල් 7,346 ක් දක්වා පහළ බැස ඇත. ඒ අනුව නාගරික අංශයේ ආදායම ග්‍රාමීය අංශයේ ආදායමට වඩා දෙගුණයකින් වැඩි වෙයි. එමෙන්ම, ග්‍රාමීය අංශයේ දිළිඳුභාවය (ජනගහනයෙන් 31.3%) නාගරික අංශයේ දිළිඳුභාවයට (8.6%) වඩා තුන් ගුණයකටත් අධිකය. මීට අමතරව කර්මාන්ත වලින් වැඩි ප්‍රමාණයක් කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්කවල ස්ථානගත වී ඇත.

**දිවයිනේ සමස්ථ දුගී ජනගහනයෙන් 90% කට වඩා ජීවත් වන්නේ ග්‍රාමීය ප්‍රදේශවල වීම විශේෂ ලක්ෂණයකි. එම නිසා දුගී භාවය පිටු දැකීමත්, රැකියා උත්පාදනය වැඩිකරලීමත්, ප්‍රාදේශීය සංවර්ධනය මෙන්ම ආදායම් බෙදීයාමේ විෂමතාවය අඩුකරලීමත්, ග්‍රාමීය හුදකලා භාවය නැති කිරීමත් යනාදිය මුල්කරගෙන සමස්ථ දේශීය ආර්ථිකය නැංවීමේදී ගම්මාන සංවර්ධන වැඩපිළිවෙල ප්‍රමුඛත්වයක් ගනු ඇතැයි විශ්වාස කළ හැකිය.**

දිවයිනේ සංවර්ධන ක්‍රියාවලියේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරන පෞද්ගලික අංශයට වඩා, රාජ්‍ය අංශයේ මැදිහත්කරු වශයෙන් කුඩා හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය මෙම සංග්‍රාමයේ නියමුවාවීමද වැදගත් ලක්ෂණයකි.

## කෙටි කාලීන අරමුණු

* දැනට බිඳ වැටෙමින් පවතින කුඩා හා ග්‍රාමීය කර්මාන්ත ගොඩනැංවීම තුළින් නිෂ්පාදකයින්ගේ ආර්ථික හා සමාජීය තත්ත්වය ඉහළ නැංවීම.
* තරුණ පිරිස් එම කර්මාන්ත කෙරේ යොමු කිරීම.
* දේශීය හා විදේශීය වෙළඳපොළ ඉල්ලුමට සරිලන අඩු පිරිවැයක් සහිත නිෂ්පාදන වෙළඳපොළට සැපයීම.
* විශේෂිත නිෂ්පාදනයක් මත පදනම් වූ ආර්ථික රටාවක් හඳුන්වාදීම.
* දේශීයව පහසුවෙන් ලබාගත හැකි අමු ද්‍රව්‍ය උපයෝජනයට ගැනීම.
* රැකියා උත්පාදනය වැඩි කිරීම තුළින් සෘජු රැකියා උත්පාදනය මෙන්ම වක්‍ර රැකියා උත්පාදන වැඩ පිළිවෙලක් ඇති කිරීම.

## දිගු කාලීන අරමුණු

* කුඩා හා ග්‍රාමීය කර්මාන්ත නිෂ්පාදන වැඩි කිරීම තුළින්, දළ ජාතික නිෂ්පාදනයට කෙරෙන දායකත්වය ඉහළ නැංවීම.
* රැකියා වියුක්තිය හා ඌණ සේවා නියුක්තිය නැති කිරීමට දායකවීම.
* නිෂ්පාදන ගම්මාන ආශ්‍රිතව ආර්ථික හා සමාජ වර්ධනයක් ඇති කිරීම. එම ගම්මාන අයත් ග්‍රාමීය ප්‍රදේශවල පවත්නා මත් ද්‍රව්‍ය භාවිතය, මන්දපෝෂණය, සියදිවි නසා ගැනීම් වැනි ගැටළු අවම කිරීම.
* ගුණාත්මක දේශීය නිෂ්පාදන විදේශ වෙළඳපොළට සැපයීම මගින් රටේ අපනයන ආදායම ඉහළ දැමීම හා විදේශ විනිමය රට තුළට ගලා ඒමට සැලැස්වීම.
* පෙර පසු සබඳතා පසුබිම් කරගෙන ( forward linkages and back ward linkages ) මෙම ගම්මාන තුළින් නව ගම්මාන ඇති කිරීම හා ඒ ආශ්‍රිතව නිෂ්පාදන කර්මාන්ත බිහිකිරීම.

* ගම්වල ඇති හුදකලාභාවය නැති කිරීම.

* යටිතල පහසුකම් සංවර්ධනය තුළින් ගම් හා නගර සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීම.

* ශ්‍රමයේ කාර්යක්ෂමතාවය වැඩි කිරීම සහ පුහුණු ශ්‍රමයට වටිනා මිළක් නියම කිරීම.

* ආදායම් මට්ටම් ඉහළ නැංවීම තුළින් මිලදී ගැනීමේ හැකියාව වැඩි කිරීම සහ ග්‍රාමීය හා නාගරික ප්‍රදේශවල එක සමාන ආර්ථික වර්ධනයක් ඇති කිරීම

* ග්‍රාමීය ජනතාව අනන්‍යතා වශයෙන් හඳුනා ගැනීම. ඒකරාශී කිරීම. එකිනෙකා ගේ සහයෝගය ලබා ගැනීමට හැකිවන පරිදි සාමූහික හැඟීම් ජනනය කිරීම සහ ජනතා සංවිධාන (සමුපකාරය වැනි) දිරිගැන්වීම.

## කාර්මීකරණ පසුබිම

1948 දී අප රට අධිරාජ්‍යවාදීන්ගෙන් නිදහස දිනාගැනීමෙන් පසුව රට පාලනය කළ ශ්‍රී ලාංකිකයන් විසින් මෙරට කුඩා හා ග්‍රාමීය කර්මාන්ත සංවර්ධනය කිරීම තුළින් ග්‍රාමීය ජනතාව ගේ ජීවන මට්ටම ඉහල දැමීම සඳහා විවිධ ව්‍යාපෘතීන් වෙනුවෙන් කෝටි ගණන් මුදල් වැය කරන ලදී. නිදහස ලබා වසර 56 ක අත්දැකීම් අනුව අපට පෙනී යන දෙයක් නම්, මෙම උත්සාහයෙන් ග්‍රාමීය ආර්ථිකය තුළ හෝ ග්‍රාමීය ජනතාව තුළ සංවර්ධනයක් හෝ සැලකිය යුතු දියුණුවක් ඇති නොවූ බවයි. එමනිසා වර්තමානයේදී නැවත වරක් මෙම අංශ සංවර්ධනය සඳහා මුදල් යෙදවීමේදී අතීතයේදී ලැබූ අත්දැකීම් වලින් පාඩම් උගත යුතුය යන්න සිහිනබා ගත යුතුය.

ග්‍රාමීය ආර්ථිකය නංවාලීම තුළින් ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා කාලයෙන් කාලයට අප රටේ දුගී දුප්පත්කම නැති කිරීම සඳහා ජනසවිය වැඩසටහන, සමෘද්ධි ව්‍යාපාරය, ව්‍යාපෘති 15000 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ මැදිහත්වීම තුළින් ඇති කරන ලද විවිධ ස්වයං රැකියා වැඩසටහන් යනාදිය ක්‍රියාත්මක කරන ලදී. මෙම ජාතික ව්‍යාපාර තුළින් ව්‍යවසායකයන් හෝ ව්‍යාපාරිකයන් බිහිවූයේ නම්, ඒ ඉතා අනල්පාස්සක ප්‍රමාණයකි. එසේ නම් දැන් අප කළ යුත්තේ අපගේ ජනතාව මෙම අතිශය භයානක ව්‍යසනයෙන් ගලවා සිය දැනේ ශක්තියෙන් බුද්ධිය මෙහෙසා අනාගතය දෙස ස්වාධීනව බලන ජනතාවක් බවට පරිවර්තනය කිරීමයි. මෙය ඉටු කිරීම ලෙහෙසි පහසු කාර්යයක් නොවන බව සිත්හි තබා ගත යුතුය.

ජනසවිය වැඩසටහන හා සමෘද්ධි ව්‍යාපාරය එකම අරමුණකින් යුත් නමින් පමණක් වෙනස් වූ එක් පුද්ගලයෙකුගේ හෝ කිහිප දෙනෙකුගේ අවශ්‍යතා මත පදනම් වූ දේශපාලන ව්‍යාපෘති විය. එම ව්‍යාපෘති ප්‍රතිලාභීන් ගේ මානුෂික හැසිරීම, සමාජීය අවශ්‍යතා, පරිසරාත්මක සාධක ගැන කිසිදු තක්සේරුවක් හෝ සමීක්ෂණයක් නොකර ගෙඩානැගු ව්‍යාපෘති විය. මිනිස් ගුණධර්ම හැදෑරීමෙන් තොරව ආරම්භ කළ මෙම ව්‍යාපෘති සම්පූර්ණයෙන්ම පාහේ අසාර්ථක වූ බැව් පෙන්විය හැකිය. එහෙත්, එම ව්‍යාපෘතිවල සැඟවුණු ආර්ථික වටිනාකමක් තිබූ බැව් අනාවරණය කළ යුතුය.

මෙතෙක් නගර හා ඒ ආශ්‍රිතව ක්‍රියාත්මක වූ කාර්මික ව්‍යාපෘති ග්‍රාමීය ප්‍රදේශවලට යාම සංවර්ධන ව්‍යාපෘතියක් යන්න පිළිබඳ සරල අදහසක් ප්‍රතිලාභීන් තුළ ජනිතවීම, මූල්‍ය ආයතන ගම් මට්ටමින් ඇතිවීම, මූල්‍ය ආයතනවලට ගොස් ගණුදෙනු කිරීමේ ක්‍රමෝපායන් පිළිබඳ ගම්බද ජනතාව දැනුවත්වීම, භාණ්ඩ අලෙවිය පිළිබඳ සරල අදහසක් ගැමියන් තුළ ඇතිවීම, ව්‍යවසායකයා හා ව්‍යවසායකත්වය පිළිබඳව අදහසක් ප්‍රතිලාභීන් තුළ ඉස්මතුවීම, යටිතල පහසුකම් සංවර්ධනයවීම ධනාත්මක ලක්ෂණ අතර වේ.

විශේෂයෙන්ම පසුගිය කාලයේ ඇති කරන ලද ඇඟලුම් කම්හල් 200 වැඩ පිළිවෙල නගරයෙන් ගමට කම්හල් විතැන්වීමක් පෙන්නුම් කෙරේ. විශාල ව්‍යාපාරිකයන් කම්හල් ආරම්භ කිරීමේදී ඊට අවශ්‍ය යටිතල පහසුකම් විදුලිය, ජලය, මහා මාර්ග වැනි දේ රජයේ මැදිහත් වීම යටතේ සපයන ලදී. ලංකාවේ ප්‍රථම වතාවට "නගරයෙන් ගමට " කම්හල් ව්‍යාප්ත වූයේ, මෙම කම්හල් 200 වැඩසටහන යටතේ යයි පැවසීම සත්‍ය කරුණකි. මීට අමතරව, ගම්උදාව වැනි වැඩ සටහන්වලදී දේශපාලන අභිමතාර්ථයන් මුදුන් පමුණුවා ගැනීමට අමතරව ග්‍රාමීය ප්‍රදේශ යම්කිසි මට්ටමකින් දියුණු වූවා යයි කිව හැකිය. පසුකාලීනව ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනය කිරීමේදී විදුලිය වැනි සාධක කලින් ගමට ගොස් නොතිබුණා නම් ඒවා නගරාශ්‍රිතව සිට ගෙන යාමට සිදුවන හෙයින්, ඒ සඳහා විශාල මුදලක් වියදම් කිරීමට ඉඩ තිබුණි.

කෙසේ වුවත් කළමනාකරණ හැකියාවන් නොමැතිවීමත්, මූල්‍ය විනය නොතිබීමත්, ව්‍යවසායකයන් සතු ගති ලක්ෂණ පිළිබඳව ඇති අනවබෝධයන් නිසා, පසු පරීක්ෂණ නොකිරීම හේතු කොටගෙන මෙම ව්‍යාපාර වලින් වැඩි කොටසක් අසාර්ථක වූ බැව් කිව යුතුය.

**මානව හැසිරීම්, මිනිස් ගුණධර්ම ගැන විධිමත් හැදෑරීමකින් තොරව ක්‍රියාත්මක කිරීමට උත්සාහ ගන්නා වූ සියළුම ජාතික ව්‍යාපෘති හෝ වෙනත් සංවර්ධන ව්‍යාපෘතීන් අතීතයේදී අසාර්ථක වී ඇත්තාසේම, අනාගතයේදීත් අසාර්ථක වේයැයි සිතිය හැකිය.**

මෙයට පිළියමක් වශයෙන් කුඩා හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය ඉතාමත් නිවැරදි දැක්මක් මෙන්ම අතීත අත්දැකීම් සැලකිල්ලට ගනිමින් මෙම කර්මාන්ත ගම්මාන සංවර්ධන වැඩසටහන සැලසුම් කර ඇත. ග්‍රාමීය ජනතාවගේ සමාජ, ආර්ථික, සමාජීය, අධ්‍යාත්මික සංවර්ධනය පිළිබඳ සැලකීමේදී භෞතික සංවර්ධනය ගැන පමණක් විශ්වාසය නොතබා ඊට සමගාමීව අධ්‍යාත්මික සංවර්ධනය ගමට ගෙනයා යුතුයැයි ඒ මගින් තරයේ විශ්වාස කරයි.

මෙවන් පසුබිමක් තුළ ග්‍රාමීය ප්‍රදේශ සඳහා ලබාදෙනු ලබන තාක්ෂණික වැඩසටහන් ඇතුළු ඥාණය ඔවුන්ට උරාගත හැකිවන පරිදි සුදුසු පරිසරයක් ගම්වල බිහි කළ යුතුය. එසේ නොවුණහොත් මෙම සියලුම ව්‍යාපෘතිවල ප්‍රතිලාභ අපතේ යනු නියතය.

එසේ අපතේ යාම වලක්වා අපේක්ෂා කරන්නාවූ සියල්ල උරාගත හැකි පරිසරයක් ග්‍රාමීය ප්‍රදේශ තුළ නිර්මාණය කිරීම සඳහා වන ව්‍යාපෘතිය " **ගුරු පැහැයෙන් රන් පැහැයට** " නම් වේ.

## නව සංවර්ධන උපාය මාර්ග ගුරු පැහැයෙන් රන් පැහැයට

ගම්වල වෙසෙන ජනතාවගේ සිත් තුළ ඇති ගුරුපාට හෙවත් අපැහැදිලි බවින් වඩා සුපැහැදිලි වූ රත්තරන් වර්ණය කරා ලංවීම මෙමගින් අදහස් කෙරේ. වෙනත් විදියකට පැහැදිලි කරන්නේ නම්, ග්‍රාමයේ පුනර්ජීවනය අරඹයා ක්‍රියාත්මක වන්නාවූ ව්‍යාපෘතියෙහි ඇති ගුරුපැහැයට නැතහොත්, අපැහැදිලි බවට එරෙහිව සුපැහැදිලි බව සඳහා මෙම ව්‍යාපෘතිය උපකාරී වන්නේය.

**ග්‍රාම සංවර්ධනය අරභයා සියළු බලවේග ඒකරාශී කිරීමේදී ඇති අපැහැදිලි බවට එරෙහිව සුපැහැදිලි බව සඳහා මෙම ව්‍යාපෘතිය උපකාරී වේ. ග්‍රාමීය ජනයාගේ නිදහස් චින්තන රටාවට එරෙහි වන්නා වූ අපැහැදිලි බවට පිළියමක් වශයෙන් මෙම ව්‍යාපෘතිය ඉදිරිපත් කර ඇත. සමස්ථ ග්‍රාමයේ සමාජීය, අධ්‍යාත්මික, ආර්ථික පුනර්ජීවනය අරභයා ක්‍රියාත්මක කරන්නාවූ සමස්ථ ව්‍යාපෘතීන් ගේ ගුරු පැහැයට නැතහොත් අපැහැදිළි බවට එරෙහිව සුපැහැදිලි බව සඳහා මෙම ව්‍යාපෘතිය උපකාරී වේ.**

## දියුණු කිරීමට අපේක්ෂිත කර්මාන්ත වර්ග

කුඩා හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය මගින් කර්මාන්ත වර්ග 52 ක් පමණ මේ වනවිට දියුණු කළ හැකි කර්මාන්ත ලෙස හඳුනාගෙන ඇත.

★ වාත්තු කර්මාන්තය
★ කොහු කෙඳි නිෂ්පාදනය
★ මැටි කර්මාන්තය
★ වේවැල් නිෂ්පාදනය
★ හස්ත කර්මාන්තය
★ කම්හල් කර්මාන්තය
★ කළුගල් ආශ්‍රිත කර්මාන්තය
★ වඩු කර්මාන්තය
★ තල් කොළ ආශ්‍රිත කර්මාන්ත
★ භාණ්ඩ නිෂ්පාදනය
★ කජු නිෂ්පාදන
★ කොස් නිෂ්පාදන
★ පොල් ආශ්‍රිත නිෂ්පාදන
★ ඩොලමයිට් නිෂ්පාදනය
★ උක් ආශ්‍රිත කර්මාන්ත
★ සුරතල් මසුන් ඇති කිරීම
★ බුලත් නිෂ්පාදනය

ආදිය මේ අතුරින් කිහිපයකි.

## තාක්ෂණ සංවර්ධනය

නව හා වැඩි දියුණු භාණ්ඩ නිෂ්පාදනය කළ හැකි අන්දමේ ඔබින තාක්ෂණය කර්මාන්ත ගම්මානවලට හඳුන්වා දිය යුතුය. විද්‍යාව හා තාක්ෂණය උපයෝගී කර ගැනීමේදී වැඩි ශ්‍රමයකුත්, අඩු ප්‍රාග්ධනයකුත් යෙදවෙන දේශීය සම්පත් මත පදනම් කර්මාන්ත දියුණු කිරීමට අදාළ පරිදි දැනුම ගලපා සකස් කිරීම අතිශයින් වැදගත්ය. මේ තුළින් අලුත් රැකියා බිහිවිය යුතු අතර, තිබෙන රැකියා සුරක්ෂිත විය යුතුය. එහි විශේෂ ලක්ෂණය වන්නේ ශ්‍රමය බහුලව යොදා ගැනීම, සරල බව, අඩු ආයෝජනය, සුළු පරිමාණවීම, පරිසර දූෂණය අවම කිරීම මෙන්ම ස්වභාවික සම්පත් විනාශ වීම වලකාලීමයි. මහා පරිමාණ නිෂ්පාදනයේදී යොදා ගන්නා තාක්ෂණයෙන් ලෝකයේ දුගී ජනතාවට සෙතක් සැලසිය නොහැකි බව ගාන්ධිතුමා විසින් වරක් පවසා ඇත. ඔවුන්ට සෙත සලසාදීමට නම් ගම්බද ජනතාව ආර්ථික ක්‍රියාදාමයට වැඩි වැඩියෙන් සහභාගී කරවා ගත යුතුය. ග්‍රාමීය මිනිසා යන්ත්‍රවල වහලකු කිරීම වෙනුවට, මිනිසාට සේවය කළ හැකි අන්දමට හා කර්මාන්තවලට ගැලපෙන පරිදි යන්ත්‍ර උපකරණ සකසා ගත යුතුය.

ගම්මාන කර්මාන්ත සංවර්ධනයේදී තාක්ෂණය සපයන ප්‍රධාන ආයතන අතර, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය, ජාතික මෝස්තර මධ්‍යස්ථානය, ජාතික ශිල්ප සභාව, මධ්‍යම තාක්ෂණය පිළිබඳ උපදේශක ආයතනය ( ITDG), කාර්මික තාක්ෂණ ආයතනය ( ITI ), තල් සංවර්ධන මණ්ඩලය, රාජ්‍ය දැව සංස්ථාව, ඒකල ජාතික ඉංජිනේරු සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානය,

ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ජාතික ආධුනිකත්ව අභ්‍යාස ආයතනය ( NITA) මරදාන, බහු තාක්ෂණ ආයතනය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය, කටුබැද්ද විශ්ව විද්‍යාලය යනාදිය වේ. පෞද්ගලික උපදේශකයන්ගේ සහායද මීට අමතරව ලබාගනු ඇත.

මැටි ආශ්‍රිත නිෂ්පාදන, කොහු නිෂ්පාදන, ආහාර හා බීම වර්ග, කිතුල් නිෂ්පාදන, දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන, රන්රිදී භාණ්ඩ නිෂ්පාදනය, ලුහු ඉංජිනේරු නිෂ්පාදන, ලෝහභාණ්ඩ හා පාවහන් නිෂ්පාදන, දැව පල්ප හා කඩදාසි නිෂ්පාදනය යනාදී ක්ෂේත්‍රවල තාක්ෂණය කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් ලබාදෙයි.

## කාර්මික සංවර්ධන මණ්ඩලයේ කාර්යභාරය

රාජ්‍ය අංශයේ ආයතනයක් වශයෙන් කුඩා හා ග්‍රාමීය කර්මාන්ත ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමේලා කාර්මික සංවර්ධන මණ්ඩලය මගින් විශාල කර්යභාරයක් ඉටුවිය යුතුය. මේ සඳහා වේගවත් කාර්මීකරණ වැඩපිළිවෙලක් දියත් කළ යුතු වේ.

- ගම්බද ප්‍රදේශවල රැකියා උත්පාදනය මෙන්ම ව්‍යවසායක පන්තියක් බිහිකිරීම
- තාක්ෂණික හුවමාරු වැඩසටහන් පැවැත්වීම
- කළමනාකරණ දැනුම ලබාදීම
- දේශීය හා විදේශීය වෙළඳපොළ පහසුකම් ලබාදීම
- දියුණු හා ඵලදායී යන්ත්‍ර සහ උපකරණ නිෂ්පාදනය කිරීම
- ව්‍යාපෘති වාර්තා පිළියෙල කිරීම ආදිය

ඒ අතර වේ.

මණ්ඩලයේ තාක්ෂණික සේවා අංශය ඇතුළත්ව පළාත් හා දිස්ත්‍රික් කාර්යාල නියෝජනය වන පරිදි එක් එක් ව්‍යාපෘති සම්බන්ධීකරණ කේෂත්‍ර 10 ක් සඳහා සම්බන්ධීකාරකවරු පත් කර ඇත.

අදාළ සම්බන්ධීකාරකවරුන් මගින් දිවයිනෙත් විවිධ පළාත් හා දිස්ත්‍රික් කාර්යාලවල සේවය කරනු ලබන නිලධාරීන්ගේ සහාය ඇතිව සංවිධානය කරනු ලබන වැඩසටහන්වලට සෘජුව සම්බන්ධ වී ව්‍යවසායකයනට අවශ්‍ය සේවාවන් ලබාදෙනු ඇත.

මෙම කේෂත්‍ර හඳුනාගෙන රාජ්‍ය හා පෞද්ගලික ආයතන කාර්මික විද්‍යාල හා වෙනත් ආයතනවල පුහුණු ශිල්පීන් හා උපදේශකයන්ගේ සහාය ඇතිව තාක්ෂණික හුවමාරු වැඩසටහන් පවත්වනු ලැබේ.

මීට අමතරව තෝරා ගත් ගම්මානවල කර්මාන්තකරුවන් සඳහා මූලික කළමනාකරණ වැඩසටහන් පවත්වා ඔවුන්ගේ කළමනාකරණ හැකියාව වැඩි දියුණුකර, ඔවුන් ව්‍යවසායකයන් බවට පරිවර්තනය කිරීමද අපේක්ෂිතය. යෝජිත කළමනාකරණ වැඩසටහන් තුළ, කළමනාකරණ වශයෙන් (කළමනාකරණ, අලෙවි, මුදල්, සේවක) ගම්මාන වල කර්මාන්තකරුවන් ගේ සැලසුම් කිරීමේ හැකියාව වැඩිදියුණු කිරීම, නායකත්වය, කැපී පෙනීම යනාදී ගුණාංග බිහි කිරීම, සමස්ථ ගම්වාසීන්ගේ එකමුතුකම, සහෝදරත්වය, සදාචාරය තුළින් සහජීවනය ඇති කිරීම යනාදිය ඇතුළත් වේ. එමෙන්ම, ජාත්‍යාන්තර කම්කරු සංවිධානය, අලෙවිකරණය, පිරිවැයකරණය, මිලදී ගැනීම, තොග පාලනය, මූල්‍ය සැලසුම්කරණය, ගණුදෙනු වාර්තා තබා ගැනීම යනාදී විෂය කේෂත්‍රයන් මෙම පාඨමාලාවට ඇතුළත් වේ.

## බාධක හා ගැටළු

එක් එක් ගම්මානවල සංවිධානය කළ හැකි කර්මාන්ත වර්ග රාශියක් ඇති අතර, ඒ සඳහා සුදුසු උපදේශකයන් ලබාගැනීමට නොහැකිවීම මුහුණුපෑමට ඇති ගැටලුවකි. උපදේශකයන්ගේ හිඟතාවය සහ කලට වේලාවට ලබාගැනීමට නොහැකි වීම නිසා තාක්ෂණික පුහුණු වැඩසටහන් සාර්ථකව නිම කිරීමට නොහැකි වන අවස්ථාද ඇත.

නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ අලෙවි කිරීමේදී අලෙවීමය ගැටළු පැන නගී. විශේෂයෙන් නොදියුණු තාක්ෂණ ක්‍රම භාවිතා කරනු ලැබුවහොත් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩවල නිමැවුමද පහල මට්ටමක පැවතිය හැකිය. එම භාණ්ඩ මිලදී ගැනීම සඳහා පාරිභෝගිකයන් උදාසීන ගතියක් දැක්වීම සාමාන්‍ය ස්වරූපයයි. එබැවින් මෙම භාණ්ඩ මිලදී ගැනීම සඳහා වෙනමම ආයතනයක් හෝ යාන්ත්‍රණයක් පිහිට විය යුතුය. එමගින් අලෙවි ප්‍රශ්ණයට විසඳුමක් ලැබෙනු ඇත.

කර්මාන්ත පවත්වාගෙන යාමේදී කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා ණය මුදල් ලබාදීමට සිදුවේ. මේ සඳහා දැනට පිහිටුවා ගනු ලබන සමුපකාර සමිති මගින් ණය මුදල් ලබාදීමට සැලසුම්කර ඇත. එහෙත් සමුපකාර ව්‍යාපාර කොතෙක් දුරට සාර්ථකව කටයුතු කෙරේද යන්න ප්‍රශ්ණ සහගතය.

පොදු පහසුකම් මධ්‍යස්ථාන ඉදිකිරීම, පවත්නා මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම, ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය යටතේ සිදුවේ. ඒ තුළ රැස්වීම්ශාලා පිහිටුවීම, පොදු පහසුකම් මධ්‍යස්ථාන තුළ අමුද්‍රව්‍ය ගබඩා පහසුකම් ඇති කිරීම, පර්යේෂණාගාර ඇති කිරීම, අලෙවි පහසුකම් සැපයීම සඳහා අලෙවි කුටි ඉදිකිරීම වැනි දේ ඉටු කිරීමට අපේක්ෂිතය.

පොදු පහසුකම් මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා ඉඩම්



ලබාගැනීම ක්ෂණිකව සිදුකළ යුතු වුවත් ලංකාවේ පවතින නීති අනුව ඉඩම් ලබා ගැනීම පහසු කටයුත්තක් නොවනු ඇත. එමගින් විශාල ප්‍රමාදයක් සිදුවේ. දෙවනුව හඳුන්කූරු වැනි දේ නිෂ්පාදනය කිරීමේදී උණබට අවශ්‍ය වන අතර, ඒ සඳහා බලපත්‍ර ලබාදිය යුතුව ඇත.

මීට අමතරව කෘෂිකාර්මික භෝග වගා කිරීමේ ගම්මාන ආරම්භ කිරීමේදී රාජ්‍ය ආයතනවල සහයෝගය ලබාගත යුතුවේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා වගා නිලධාරී සහාය මේ අතර ප්‍රමුඛස්ථානයක් ගනී. එම සහායන් කලට වේලාවට ලබා ගැනීම සඳහා මනා සම්බන්ධීකරණයක අවශ්‍යතාවය පැන නගී. අනෙක් අතට රටේ සියලුම ප්‍රදේශයන් සහ ප්‍රධාන වරාය, ගුවන් තොටුපලද සම්බන්ධ කෙරෙන අධිවේගී මාර්ග පද්ධතියක් ගොඩනංවන තුරු කර්මාන්ත ප්‍රාදේශීය වශයෙන් ව්‍යාප්ත කිරීමේ රජයේ අරමුණ ඉටුකර ගැනීමට නොහැකි වනු ඇත.

## සමාප්තිය

කුඩා හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය පොදුවේ මෙම ව්‍යාපෘතිය සඳහා මැදිහත්වීම ගම්මාන වැඩසටහනේ දැකිය හැකි සාධනීය ලක්ෂණයකි. එමෙන්ම එම අමාත්‍යාංශය සතු පුනර්ජීවන අරමුදලින් මෙම ව්‍යාපෘතිය සඳහා මුදල් වෙන්කරන බැවිද දැනගන්නට ඇත. එමෙන්ම වසර ගණනාවක් තිස්සේ වැඩිදියුණු වෙමින් පැවති දේශීය කර්මාන්ත පද්ධතිය පිළිබඳ නිසි අවධානය යොමු නොකර, විවෘත ආර්ථිකය මත පමණක් විශ්වාසය තැබීම නිසා, ශ්‍රී ලංකාව නිෂ්පාදන ආර්ථිකයෙන් ඈත්වී පාරිභෝගික ආර්ථිකයට සීමා වී ඇත. මෙම තත්ත්වය ඉතා ඉක්මණින් වෙනස් කළ යුතු වෙයි. අතර මැදියකු නොමැතිව සාමාන්‍ය භාණ්ඩ විදේශ වෙළඳපොළ දක්වා අලෙවිකර දීම සඳහා අමාත්‍යාංශය මැදිහත්වන බැවින්, සම්ප්‍රදායි නිෂ්පාදන සඳහා හොඳ අනාගතයක් ඇති වේයයි සිතිය හැකිය.

එමෙන්ම, පැණි හකුරු නිෂ්පාදන කර්මාන්තයක් වශයෙන් ආරම්භකර විදේශ වෙළඳපොළේ ඉල්ලුමක් ඇති කිරීම සඳහා අප මෙතෙක් පියවරවල් ගෙන නොමැත. මෙම පැණි හකුරු වැනි දේ වඩාත් සිත් ඇද ගන්නා සුළු ඇසුරුම්වල අසුරා නවීන ප්‍රචාරක මාධ්‍ය තුළින් විදේශීය රටවල අලෙවි කිරීමට වැඩපිළිවෙලක් සකස් කරන්නේ නම්, ඒ තුළින් විශාල ඉල්ලුමක් ඇති කිරීමට හැකිවේ යයි සිතිය හැකිය.

ඉහතින් සඳහන් කළ වැඩපිළිවෙල සාක්ෂාත් කර ගැනීම සඳහා කුඩා හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශයේ " **ගුරු පැහැයෙන් රන් පැහැයට**" නමැති වැඩ පිළිවෙල ඉදිරිපත් කර ඇති බැව් පෙනේ. ආර්ථික පුනර්ජීවනය අරභයා ආරම්භ කර ඇති නිෂ්පාදන කර්මාන්ත ගම්මාන වැඩපිළිවෙල සඳහා වසර 03 ක් යන තෙක් අමාත්‍යාංශය සෘජුවම මැදිහත් වනු ඇති අතර එමගින් අපේක්ෂිත අරමුණු කරා ලඟාවීමට හැකිවේ යැයි සිතිය හැකිය.

## මූලාශ්‍ර:


1. ගුරු පැහැයෙන් රන් පැහැයට විස්තර: සංවර්ධනය හා පර්යේෂණ ඒකකය, කුඩා හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය

2. නව සංවර්ධනය උපාය මාර්ගයක අවශ්‍යතාවය: ආර්ථික විමසුම 1990 දෙසැම්බර්

3. මහ බැංකු වාර්තාව 2003

4. කර්මාන්ත ගම්මාන 100 ක් සංවර්ධනය කිරීම: ලක්බිම 2005-04-23

5. ග්‍රාමීය කර්මාන්තකරුවන්ට විදෙස් වෙළඳපොළ අවස්ථා: දිනමිණ 2005 මැයි මස 26

6. කර්මාන්ත ගම්මාන දහසක් සංවර්ධනය කිරීමේ ජාතික වැඩපිළිවෙල ඉදිරියටත් ගෙන යනවා. *දිනමිණ 2005.02.03*